370.7
W8C

# අධ්‍යාපන ක්ෂේත්‍රයේ කළමනාකරුවන්ගේ ඉගෙනුම් ශෛලීන්

(ශ්‍රී ලංකාවේ පාසැල් ගුරුවරුන්, අංශ ප්‍රධානීන් සහ විදුහල්පතිවරුන් සම්බන්ධව කරන ලද අධ්‍යයනයක්)

# LEARNING STYLES OF MANAGERS IN THE EDUCATIONAL PROFESSION

(A STUDY WITH TEACHERS, SECTIONAL HEADS AND PRINCIPALS OF SCHOOLS IN SRI LANKA)

පර්යේෂණාත්මක නිබන්ධය (1994/96)

දර්ශනපති උපාධිය

ඩබ්. ජ්. ආර්. වික්‍රමාරච්චි

519961

# සාරාංශය

ගුරු වෘත්තිකයන්ගේ ඉගෙනුම් ශෛලීන් හඳුනාගැනීම සඳහා මෙම අධ්‍යයනය සිදු කෙරිණ. මීට අමතරව මනෝවිද්‍යාත්මක සහ සමාජ මනෝවිද්‍යාත්මක සාධක කීපයක් ඉගෙනුම් ශෛලීන් සමග සම්බන්ධ වන ආකාරය පිළිබඳව ද විමසනු ලැබීය. මෙහිදී ගුරු වෘත්තිකයන් ලෙස හඳුන්වන ලද්දේ, පාසල් පද්ධතිය තුළ සිටින ගුරුවරුන්, අංශ ප්‍රධානීන් සහ විදුහල්පති වරුන්ය. ඔවුන් සියළු දෙනාම කළමනාකරුවන් වශයෙන් සළකන ලදී.

වර්තමාන අධ්‍යයනය සඳහා ගුරු වෘත්තිකයන් **552**කින් යුත් නියැදියක් යොදා ගන්නා ලදී. එයට ගුරුවරුන් **248**ක්, අංශ ප්‍රධානීන් **134** ක් සහ විදුහල්පති වරුන් **170** ක් අයත්විය. අධ්‍යයනයට අවශ්‍ය දත්ත ලබා ගැනීම සඳහා උපකරණ දෙකක් භාවිතා කෙරුණි. පළමු උපකරණය වූයේ ඉගෙනුම් ශෛලීන් හඳුනාගැනීම සඳහා යොදා ගත් ඉගෙනුම් ශෛලීන් පිළිබඳ ප්‍රශ්නාවලිය [Learning Style Questionnaire (LSQ)] යි. මෙය කළමනාකරුවන්ගේ ඉගෙනුම් ශෛලීන් හඳුනාගැනීම සඳහා, බ්‍රිතාන්‍ය ජාතික Honey සහ Mumford (1982) විසින් නිර්මාණය කරන ලද්දකි.

දෙවන උපකරණය වූයේ ඉගෙනුම් ශෛලීන් සහ විමසන ලද සාධක අතර සම්බන්ධතාවය හඳුනා ගැනීම සඳහා පර්යේෂිකාව විසින් සකස් කළ කෙටි ප්‍රශ්නාවලියකි. ඉහත සඳහන් උපකරණ වලට දැක්වූ ප්‍රතිචාර අනුව ලැබුණු දත්ත විශ්ලේෂණයෙන් ලබාගත් ප්‍රතිඵල මගින් වැදගත් කරුණු කීපයක් අනාවරණය විය. ඒ අනුව පර්යේෂිකාවට පහත දැක්වෙන නිගමන වලට එළඹීමට හැකිවිය.

1. කළමනාකරුවන් සේ උපකල්පනය කළ ගුරුවරුන්, අංශ ප්‍රධානීන් සහ විදුහල්පති වරුන්ගේ ඉගෙනුම් ශෛලීන් වල වෙනස්කම් හඳුනා ගැනීමට හැකිවිය. කළමනාකරණය පිළිබඳව වැඩි අත්දැකීම් ලබන අංශ ප්‍රධානීන් හා විදුහල්පති වරුන්, LSQ මගින් හඳුනාගත් ඉගෙනුම් ශෛලීන් දෙකක් වන න්‍යායවාදී (theorist)

සහ උපයෝගිතාවාදී (pragmatist) ශෛලීන් සඳහා ගුරුවරුන්ට වඩා වැඩි මධ්‍යන්‍ය අගයක් ලබයි. මේ අනුව විවිධ තනතුරු සහ පුහුණු පාඨමාලා සංවිධානයේදී ගැලපෙන ශෛලීන්ට අනුව වැඩ සටහන් සකස් කළ හැක.

2. ඉගෙනුම් ශෛලීන් කෙරෙහි මනෝ විද්‍යාත්මක හා සමාජ මනෝවිද්‍යාත්මක සාධක කීපයක බලපෑම අපේක්ෂිත රටාවක් අනුව සිදුවන බව මෙම අධ්‍යයනයෙන් හෙළි විය. උදාහරණ ලෙස වෘත්තිය වශයෙන් වැඩි තෘප්තියක් ලැබීම, වඩා හොඳින් සමාජ සම්බන්ධතා පැවැත්වීම වැනි සාධක වලදී උසස් හැකියාවන් සහිත ඉගෙනුම් ශෛලීන් සමග සංඝටනය විය. එම අවස්ථාවලදී වඩා වැඩි කළමනාකරණ අත්දැකීම් ලැබීම මීට හේතු විය හැක. මේ අනුව Kolb (1976) විසින් ඉදිරිපත් කළ වර්තමාන අධ්‍යයනය සඳහා පදනම් වූ ඉගෙනුම් න්‍යාය (Experiential Learning Theory) සනාථ වීමට සාක්ෂි ලැබේ.

3. මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල අනුව LSQ උපකරණය මගින් පාසල් පද්ධතිය තුළ විවිධ තනතුරු විභේදනය වීමක් සිදුවී ඇත. එමනිසා LSQ හි නිර්මාණ වලංගුතාව (Construct validity) සඳහා සාක්ෂි ලැබේ. තවද ගුරු වෘත්තිකයන්ගේ ඉගෙනුම් ශෛලීන් ආශ්‍රිත දැනුම අනුව කළමනාකාරණයක නිරත වීම පිළිබඳව පෙර කීමේ හැකියාවක් ලැබේ. එමනිසා LSQ හි අනාගත සූචක වලංගුතාව (Predictive validity) සඳහාත් සාක්ෂි ලැබේ.

4. තවද LSQ උපකරණය මගින් කළමනාකරුවන්ගේ ඉගෙනුම් ශෛලීන් විග්‍රහ කිරීම සඳහා යොදා ගත් සංඛ්‍යා විද්‍යාත්මක ක්‍රම දෙකක් වන, Honey and Mumford (1982) ගේ ක්‍රමය සහ Allinson සහ Hayes (1988) ගේ ක්‍රමය අතර ප්‍රතිඵල වල එකඟතාවක් පවතින බව ද නිගමනය කළ හැක.



PERMANE...
FOR ... THE
LIB... ONLY

# ABSTRACT

This study was conducted to identify learning styles of personnel in the teaching profession. An attempt was also make to relate certain psychological and socio-psychological factors to their learning styles. In the present study the personnel in the teaching profession comprised of teachers, sectional heads and principals and all were considered as managers.

A sample of 552 personnel in the teaching profession was selected for the current study. In the sample 248 teachers, 134 sectional heads and 170 principals were included. Two instruments were used in obtaining the data pertaining to this study. The Learning Styles Questionnaire (LSQ) which was used to identify learning styles was the first instrument. British psychologists, Honey and Mumford (1982), constructed this questionnaire to identify learning styles of managers. The second instrument was a short questionnaire made by the researcher to identify the relationship between learning styles and the factors investigated.

Analysis of data obtained by virtue of responses to the instruments yielded several important findings. Accordingly, the researcher could come to the following conclusions.

1. It was possible to identify differences in the learning styles of teachers, sectional heads and principals. Principals and sectional heads who have greater managerial experience scored more than teachers in the LSQ's higher learning styles of Theorist and Pragmatist.

   Accordingly, training programmes for different teacher personnel could be organized to match their different learning styles.

2. It could be seen that the influence of the psychological and socio-psychological factors investigated fell into an expected pattern. Thus high professional satisfaction and having good social relationships, such factors were associated with learning styles of high ability. In these instances, the probable cause may be that of receiving a greater frequency of managerial experience. Thus it may be said that the present study provided evidence for Kolb's (1976) Experiential Learning Theory on which it was based.

3. The results of this study show that the instrument LSQ was able to differentiate different teacher statuses within the school system. This provided evidence of construct validity for the LSQ. In addition it was possible to foretell from a knowledge of teacher personnels' learning styles their managerial position. Hence evidence was obtained regarding predictive validity of the LSQ instrument.

4. It could also be concluded that there is agreement in the results of learning styles of managers when the LSQ instrument is analysed by the two statistical methods adopted by Honey and Mumford (1982) and Allinson and Hayes (1988).